# පුහුණුකරුවන් පුහුණු කිරීම පිළිබඳ පුහුණු මොඩියුලය

*තරුණයා වැඩලෝකයට සංක්‍රමණය වීමේදී බලපාන තිරසර ප්‍රතිපත්ති ප්‍රචලිත කිරීම.*

UNITED NATIONS ESCAP
Economic and Social Commission for Asia and the Pacific

N Y S C

FSHS

Foundation for Strengthening Human Skill

## පෙරවදන

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආසියානු හා පැසිපික් කලාපීය ආර්ථික හා සමාජයිය කොමිසම විසින් කලාපීය රාජ්‍ය වල පාසල් ශිෂ්‍ය හා තරුණ ප්‍රජාව වැඩලොවට සංක්‍රමණය වීමේදී ඊට බලපානු ලබන ප්‍රතිපත්තීන් හඳුනාගැනීම හා බලගැන්වීම සඳහා තාක්ෂණික හා මූල්‍ය පහසුකම් සපයයි. මෙහිදී ප්‍රධාන වශයෙන් පහත අංශ කෙරෙහි අවධානය යොමු කෙරේ.

1. සියළු පාර්ශවයන් සඳහා ප්‍රතිලාභ ලැබෙන ප්‍රතිපත්තීන් පිළිබඳ තරුණ ප්‍රජාව සවිබල ගැන්වීම,
2. ප්‍රතිපත්ති සම්පාදකයින් දැනුවත් කිරීම/සවිබලගැන්වීම,
3. තිරසර ප්‍රතිපත්ති  සියළු පාර්ශවයන් සමග බෙදාහදා ගැනීම,
4. විවිධ පාර්ශවකරුවන් අතර සහසම්බන්ධතාවය ප්‍රවර්ධනය කිරීම,
5. පුහුණුව මඟින් වැඩකිරීමේ ධාරිතාවය වර්ධනය කිරීම,

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබද අමාත්‍යාංශය, තරුණයා හා පාසල් ශිෂ්‍යයා වැඩලොවට සංක්‍රමණය වීමේදී බලපාන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන රාජ්‍ය හා පෞද්ගලික ආයතන, වෘත්තීය පුහුණුව හා වැඩලොව අභිමුඛ අභිප්‍රේරණ වැඩසටහන් ක්‍රියාත්මක කරන ආයතන, එක්ව මෙම විද්‍යුත් පහසුකාරක උපාංග පරිශීලනය කර නව ප්‍රතිපත්ති සම්පාදනය කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

ජාතික තරුණ සේවා සභාව විසින් බාහිර පාර්ශවයන්ගේ සහයෝගය, තාක්ෂණික මඟපෙන්වීම හා උපායමාර්ගික ක්‍රමවේදයන් භාවිත කරමින් මෙම ප්‍රතිපත්ති ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරනු ලබන අතර මේ සඳහා අදාළ විෂයන් පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර අත්දැකීම් ඇති මානව සම්පත් ඵලදායිතාකරණ පදනම හරහා ධාරිතා සංවර්ධන පුහුණු හා අධ්‍යයන මෙවලම් ඉදිරිපත් කරනු ලබයි.

මේ අනුව පුළුල් ආයතනික මැදිහත්වීමක් හා ජාත්‍යන්තර ප්‍රතිපත්තීන් පිළිබඳ රාජ්‍යයන් අතර දැනුම හා අත්දැකීම් හුවමාරු කරගැනීමට මෙම විද්‍යුත් මෙවලම් හා පහසුකම් භාවිත කෙරෙනු ඇත. මින් ඉදිරිපත් කරනු ලබන  පුහුණු මොඩියුල ශ්‍රී ලංකාවේ හා කලාපීය රාජ්‍යවල පුහුණු හා රැකියා උත්පාදනයේදී තරුණ ප්‍රජාව තුල පෞරුෂ ගුණාංග සංවර්ධනය සඳහා ඉවහල් කරගැනීමට අපේක්ෂා කෙරේ.

UNITED NATIONS ESCAP
Economic and Social Commission for Asia and the Pacific

NYSC

FSHS

Foundation for
Strengthening
Human Skill

<u>**කතුවැකිය**</u>

මෙම පුහුණු මොඩියුලය මගින්, පාසලින් වැඩලොවට සංක්‍රමණය වීමේදී ශිෂ්‍ය හා තරුණ ප්‍රජාව ළඟාකර ගත යුතු කුසලතාවයන් ලඟාකර ගැනීම සඳහා තාක්ෂණික මඟපෙන්වීම් ලබා දෙනු ලැබේ. තරුණ ප්‍රජාව සම්බන්ධව ඍජුවම කටයුතු කරනු ලබන ප්‍රතිපත්ති සම්පාදකයින්, ගුරුවරුන්, වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ නිරතවන්නන්, පුහුණු පහසුකම් සපයන්නන් හා තරුණ ප්‍රජාවට ස්වයං අධ්‍යනයන් මගින් තම සේවා ධාරිතාවය වර්ධනය කිරීම පිණිස සකස් කර ඇත.

මෙම පුහුණු මොඩියුලය ක්‍රියාත්මක කිරිමේදී එහි පුහුණු කාලවකවානු පිළිබඳ තීරණය කිරිම ප්‍රධාන පහසුකම් සපයන්නා විසින් තීරණය කළ යුතුය. ඉලක්ක පිරිසේ අවශ්‍යතාවය මත පුහුණු කාලසීමාවන් තීරණය කළ යුතු අතර එය එක් දින පුහුණු වැඩසටහනක් හෝ දින දෙකහමාරක පුහුණුවක් ලෙස ක්‍රියාත්මක කිරිමට හැකි වන පරිදි විෂයපථය පෙළගස්වා තිබේ. පුහුණුවෙන් අනතුරුව නැවුම්කරණ එක් දින සාකච්ඡාවක් පුහුණුවන්නන්ට ලබා දීමට අවැසි පරිදි විෂය කරුණු භාවිත කළ යුතුය.

පුහුණුකරුවන් පුහුණු කිරිම පිළිබඳ ඔබ විසින් සකසනු ලබන සැසි සැලැස්ම ඉතා මැනවින් සැකසිය යුතු අතර ඒ සඳහා අන්තර් ගත විය යුතු උපායමාර්ග පිළිබඳ අවධානය යොමු කල යුතුය. පුහුණු මොඩියුලයේ අන්තර්ගතයට අමතරව අදාළ විෂය පිළිබඳ අධ්‍යයනය කිරීම හා තොරතුරු ඒකරාශී කිරීම පුහුණුකරුවෙකු ලෙස ඔබගේ වගකීමක් බවට අවධාරණය කරමු. මෙම මොඩියුලය මගින් ඔබට අවැසි මඟපෙන්වීම ලබා දෙනු ඇත. එයින් දක්ෂ පුහුණුකරුවෙකුට නොබියව ඵලදායි පුහුණු සැසියක් පවත්වාගෙන යාමට අවශ්‍ය තාක්ෂණික මඟපෙන්වීම හා විෂය පෝෂක කරුණු ඉදිරිපත් කෙරේ.

ඒ අනුව මනාලෙස සැලසුම් කල සැසි සැලැස්ම හා උපකාරක භාවිත කරමින් ඉහල මට්ටමේ පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය පියවර ගත යුතුය. මීට අමතරව සහය පුහුණුකරුවෙකුගේ සේවය ලබා ගැනීමට ද අපි නිර්දේශ කරමු. එමඟින් ඔබට මගහැරීමට ඉඩ ඇති කරුණු පිළිබඳ අවධානය යොමුකිරීමට ද මහඟු අවස්ථාවක් ලැබෙනු ඇත.

**පුහුණුකරුවන් පුහුණු කිරිම.**
**පුහුණු අත්පොත**

## අන්තර්ගතය


| | |
|---|---|
| **1 කොටස** | පිටු අංකය |
| **පුහුණු අත්පොත පිළිබඳ හැඳින්වීම.** | **05** |
| **11 කොටස -** | |
| **පුහුණු මොඩියුලයේ අරමුණු** | **05** |
| **3. පුහුණු මොඩියුලයේ අන්තර්ගතය** | **06** |
| **4. පොදු හා සුවිශේෂී අරමුණු** | **07** |
| **5. පුහුණුකරුවන් සඳහා උපදෙස්** | **07** |
| **6. පුහුණුවේ ස්වභාවය (පුහුණු කාලය):** | **07** |
| **7. පුහුණු සැලැස්ම** | **07-08-09** |
| **8. පුහුණුකරුගේ භූමිකාව හඳුනාගැනීම.** | **09** |
| **9. පුහුණු සැසි සැලැස්ම.** | **10** |

## පුහුණු අත්පොත

## 01 කොටස:

### මොඩියුලයේ අන්තර්ගතය.

**1. පුහුණු අත්පොත පිළිබඳ හැඳින්වීම.**

පුහුණුකරුවන් පුහුණු කිරිම පිළිබඳ වැඩමුළුවක් / සැසියක් සංවිධානය කිරිම මනාලෙස සැලසුම් කල යුතු අතර ඒ සඳහා පුහුණුකරුවෙකුට තාක්ෂණික හා න්‍යායාත්මක දැණුම තිබිය යුතුය. සාමාන්‍ය පුහුණු සැසියකට වඩා මෙම පුහුණු අත්පොත මගින් පුද්ගල කුසලතාවයන් වර්ධනය කිරිම පිළිබඳ කතාකරනු ලැබේ. මේ නිසා පුහුණු කුසලතාවයන් ස්ථාපිත කිරිමට උවැසි උපායමාර්ග හා සම්පත් භාවිතා කල යුතුය. ගුණාත්මක පුහුණුකරුවෙකු බිහිකිරිම උදෙසා මෙහි සඳහන් කරුණු හා තාක්ෂණික මෙවලම් භාවිතා කිරිමට කටයුතු කල යුතුය.

තරුණයන් හා ශිෂ්‍ය කේන්ද්‍ර පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලබන තරුණ ක්‍රියාකාරකයින් ගුරුවරුන් හෝ පුහුණුකරුවෙකු ලෙස සේවය ලබා දීමට කැමති පිරිස්වලට ස්වයං අධ්‍යයන මඟින් දැනුම ලබා ගැනීමට හැකි ලෙස සැලසුම් කර ඇත.

මෙම පුහුණු අත්පොත මගින් පුහුණු කරුවෙකු සතුවිය යුතු ගුණාංග මෙන්ම ඔහු හෝ ඇය විසින් වර්ධනය කරගත යුතු කුසලතාවයන් පිළිබඳවද කතා කරනු ලැබේ. මීට අමතරව පුහුණුකරුවාගේ පුහුණු පෞරුෂාත්වය වර්ධනය කර වඩාත් ඵලදායි පුහුණු සැසියක් සංවිධානය කිරිම සඳහා අවශ්‍ය මඟපෙන්වීම මෙමගින් ඔබට ලබාදීමට අපේක්ෂා කරනු ලැබේ.

**2. පුහුණු මොඩියුලයේ අරමුණු.**

මෙම මොඩියුලය අවසානයේදි ඔබට,

1. පුහුණුකරුවා හා පුහුණුකරුවාගේ භූමිකාව.
2. ඉලක්ක කණ්ඩායම හෝ ඔබගේ සේවාලාභීන් හඳුනා ගැනීම.
3. පුහුණුකරුගේ පෞරුෂාත්වය.
4. පුහුණු විදි ක්‍රම ශිල්ප හඳුන්වාදීම.
5. පුහුණු විෂය පිළිබඳ හැදෑරීම.
6. පුහුණු සාර්ථකත්වය සඳහා මානසික සූදානම හා පුහුණු ඇගයීම යන කරුණු හා විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ අවබෝධය හා කුසලතාවන් වර්ධනය කරනු ලැබේ.

**පුහුණු මොඩියුලයේ අන්තර්ගතය:**

| විෂය ක්ෂේත්‍රය / අරමුණු | ක්‍රමවේදය |
|---|---|
| පුහුණුකරුවා හා පුහුණුකරුවාගේ භූමිකාව. | 01. කණ්ඩායම් ක්‍රියාකාරකම් වලින් පුහුණුකරු සහ පුහුණුකරුවාගේ භූමිකාව හඳුනාගෙන ඒ පිළිබඳ භූමිකා රංගනයක් තුළින් දැනුවත් කිරීම. |
| කණ්ඩායම හඳුනා ගැනීම. | පුහුණුවට පෙර සූදානම් කළ ප්‍රශ්නාවලියක් මඟින් ප්‍රතිලාභී පුහුණුකරු හඳුනාගනු ලැබේ. |
| පුහුණුකරුගේ පෞරුෂත්වය<br>1. අංග වින්‍යාසය (දේහමය භාෂාව - body language)<br>2. භාෂාව(උදාහරණ භාවිතය)<br>3. අවධානය ලබා ගැනීම.<br>4. කාල කළමණාකරණය.<br>5. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය භාවිතය..<br>6. පුහුණු කණ්ඩායම් මෙහෙයවීම.<br>7. ඉදිරිපත් කිරීමේ කුසලතාවය. | පුහුණුකරුවන් පුහුණු කරන්නා අදාළ ක්‍රම වේද භාවිතා කිරීම. (මේ සඳහා කණ්ඩායම් ක්‍රියාකාරකමක් මඟින් පුහුණු කුසලතාවයන් පිළිබඳව දැනුවත් කිරිම හා පුහුණු කුසලතා වර්ධනය.) |
| පුහුණු විදි ක්‍රම ශිල්ප හඳුන්වාදීම. | ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම (Power Point) |
| පුහුණු විෂය පිළිබඳ හැදෑරීම. | 01. තමා සතුවන තොරතුරු/ දැනුම නැවත පරිශීලනය.<br>02. යාවත්කාලීන වීම පිළිබඳව අවබෝධය ගැනීම.<br>03. You tube / Internet / Media. |
| පුහුණු සාර්ථකත්වය සඳහා මානසික සූදානම. | 01. පෙර සූදානම් කල පුහුණු සැසිය හා මෙවලම් නැවත පරිශීලනය කරන්න.<br>02. තමා විසින් ලබා දීමට අපේක්ෂිත පුහුණුව පිළිබඳ ස්වයං නිරාවරණ පුහුණුවක නිරත වීම අත්‍යවශ්‍ය වන අතර එමඟින් තමා තුළ ආත්ම විශ්වාසය ගොඩනැගේ.<br>03. පුහුණුව සඳහා අවශ්‍ය විද්‍යුත් පුහුණු උපකාරකවලට සමගාමීව දෘෂ්‍ය උපකාරක සූදානම් කරගන්න. (යම් තාක්ෂණික ගැටළුවක් ඇති වුවහොත් පුහුණුව සඳහා මෙම දෘෂ්‍ය උපකාරක භාවිතා කරන්න).<br>04. සිතේ කලබලකාරිබව අඩුකර ගැනිම සඳහා ආරම්භ කිරිමට පෙර සෙමින් නමුත් ගැඹුරින් හුස්ම ගන්න හා පිට කරන්න. ආරම්භ කිරිමට ඉක්මන් නොවන්න එයින් කලබලකාරි නොවන බව සහ පරිනත බව විද්‍යාමාන වෙයි.<br>05. ශරිරයේ බර පාද දෙකටම සමතුලිතවන සේ සැහැල්ලුවෙන් නමුත් කෙලින් සිටගන්න. ඔබව හඳුන්වා දීමේදී ප්‍රේක්ෂකයන් දෙස ඍජුව බලන්න. ඔබගේ දැත් වලට ස්වභාවිකව චලනය වීමට / ප්‍රකාශ කිරිමට ඉඩ හරින්න. |
| පුහුණු ඇගයීම. | ප්‍රකාශණ / පෙර සූදානම් කළ ඇගයීම් පත්‍රිකා. |

# 03. කොටස.

## 01. පොදු හා සුවිශේෂී අරමුණු.

I. පුහුණුවන්නන් තුළ ධනාත්මක වෙනසක් ඇති කිරීම සඳහා පුහුණුකරුවන් විවිධ පුහුණු ක්‍රමවේද භාවිතා කළ යුතුයි. පුහුණුවකින් අපි බලාපොරොත්තු වනුයේ පුහුණුවන්නාගේ ආකල්ප හා චර්යාවේ ධනාත්මක වෙනසක් ඇති කිරීම තුළින් පුද්ගල හැකියාවන් වර්ධනය කිරීම සඳහා සහය දැක්වීමයි.

මෙහිදී,

II. පුහුණුකරුවා සාධනීය සාධකයක් වියයුතු අතර භාවිතා කරන පුහුණු ක්‍රමවේද පුහුණු වැඩසටහනට උචිත විය යුතු අතර, පුහුණුවේ සමස්ත අරමුණු ලඟා කර ගැනීම සඳහා එමඟින් ධනාත්මක බලපෑමක් ඇති කළ යුතුය.

III. මේ අනුව වඩාත් ඵලදායි පුහුණුකරුවන් නිර්මාණය කිරීම සඳහා හඳුනාගත් ක්‍රම උපායන් හා තාක්ෂණික මඟ පෙන්වීම මෙම පුහුණු මොඩියුලය තුළින් ලබා දීමට අපේක්ෂා කල යුතුය.

## 02. පුහුණුකරුවන් සඳහා උපදෙස්.

1. ඔබගේ ඉලක්ක කණ්ඩායම හඳුනා ගන්න.ඒ අනුව පුහුණු වැඩසටහනේ කාලය හා සැසි සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්න. හැකිතාක් සහභාගිකයන් කේන්ද්‍රගත ප්‍රායෝගික පුහුණු ක්‍රම භාවිතා කිරීම මඟින් වඩාත් ඵලදායි වෙනසක් ඇති කිරීමට ඔබට හැකිවනු ඇත.

   සහභාගී වන්නන් තුළ ධනාත්මක වෙනසක් ඇති කිරීම අපේක්ෂා කරන බැවින් එම අවශ්‍යතාවයන් ඉටු වන අන්දමේ පුහුණුකරුවෙකු නිර්මාණය කිරීම සඳහා මෙම මොඩියුලය භාවිතා කළ හැකිය.

   - ඉලක්ක ගත කණ්ඩායම හඳුනා ගැනිමේ පුහුණුවෙන් පසුව තවත් කණ්ඩායමක් පුහුණු කිරීමට පුහුණු කුසලතාවයන් ඔවුන් තුළ ස්ථාපනය කළ යුතුය.
   - පුහුණුකරුවා පුහුණුව ආරම්භ කිරීමට පෙර තමාගේ පුහුණු කිරීමේ කුසලතාවයන්, ගුණාංග, පිළිබඳ අවධානය යොමු කළ යුතු අතර ඔබගේ පුහුණු හැසිරීම ආදර්ශමත් විය යුතුය.

## 03. කොටස

### 3.1 පුහුණුවේ ස්වභාවය (පුහුණු කාලය):

| ස්වභාවය | කාලය | සටහන් |
|---|---|---|
| පෙළඹවීම සඳහා වු පුහුණු වැඩමුළුව | එක් දිනයි | අනේවාසික |
| ධාරිතා වර්ධනය පුහුණු වැඩමුළුව | දින දෙකහමාරයි | නේවාසික |
| පසුවිපරම් පුහුණු වැඩමුළුව | එක් දිනයි | අනේවාසික |

## 1.2. පුහුණු සැලැස්ම 03

| අන්තර්ගතය | අරමුණු / ක්‍රමවේදය |
|---|---|
| **1. ඉලක්ක කණ්ඩායම හෝ ඔබගේ සේවාලාභීන් හඳුනා ගැනීම.** | මෙමගින් පුහුණුවට සම්බන්ධ වීමට අපේක්ෂා කරන ඉලක්ක ගත කණ්ඩායම් හඳුනා ගැනීම සඳහා ප්‍රවේශයන් හඳුන්වා දෙනු ලැබේ. ඒ අනුව,<br>**01.** පෙර සූදානම් කළ ප්‍රශ්නාවලියක් මඟින් සහභාගිකයින් පිළිබඳ තොරතුරු ලබා ගැනීම. ඔවුන් විසින් ඔබට ලබා දෙනු ලබන මෙම තොරතුරු විශ්ලේෂණය කිරීම මගින් ඉලක්ක කණ්ඩායම පිළිබඳව පූර්ව අවබෝධයක් ලබාගැනීමටත් ඒ අනුව සැසිසැලැස්ම සැකසීමටත් ඔබට හැකිවෙනු ඇත. |
| **2. පුහුණුකරු පුහුණුකරුගේ භූමිකාව හඳුනාගැනීම** | ක්‍රියාකාරකම් - 01 භාවිතා කරන්න. |
| **3. පුහුණුකරුවාගේ පෞරුෂාත්වය** | පෙර සූදානම් කළ වීඩියෝ ( උප සිරස සහිත යෙදූ) ප්‍රදර්ශනය කිරීම .එම වීඩියෝ පථතුල සඳහන් වී ඇති තොරතුරු විශ්ලේෂණය කිරීම තුළින් පුහුණුකරුගේ පෞරුෂාත්වය පිළිබඳ අවබෝධය ලබා දිය යුතුය. මේ සඳහා උචිත සිද්ධි අධ්‍යන ඇතුළත් වීඩියෝ දර්ශන තෝරාගත යුතු අතර මෙම මොඩියුලයේ සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මෙම අභ්‍යාසය ක්‍රියාත්මක කරනු ලැබේ.<br><u>**උපදෙස්-:**</u><br>I. මේ සඳහා වඩාත් උචිත වීඩියෝ දර්ශන 04ක් වත් තෝරා ගන්න. මෙම දර්ශන තුළ මාතෘකාවට අදාළ තොරතුරු හා උචිත කතාන්තර පමණක් අඩංගු විය යුතුය.<br>II. වීඩියෝපට මඟින් පුහුණුකරුගේ ධනාත්මක/ සෘණාත්මක ලක්ෂණ විශ්ලේෂණය කළ යුතුය.<br>III. පුහුණු මොඩියුලය සඳහා පුහුණුකරුගේ පෞරුෂාත්වය පිළිබඳ ඉදිරිපත් වූ කරුණු මත පදනම් සාකච්ඡාව ඉදිරියට ගෙන යාම. |
| **4. පුහුණු ශිල්ප ක්‍රම.** | **4.1. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය භාවිතය.**<br>පුහුණු වැඩසටහනක් තුළදී පුහුණුකරුගේ අපේක්ෂාව ඉටු විම සඳහා උචිත ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යය තෝරා ගත යුතු අතර එම උපකරණ මැනවින් කළමණාකරණය කර ඉදිරිපත් කළ යුතුය.<br><u>**ආදර්ශ-:**</u><br>01. පෙරලුම්පත් (Flipchart)<br><br>1. **පේළි අතර පරතරය "2" ක් විය යුතුයි.**<br>2. **දෙපස සීමාව "2.5" විය යුතුය.**<br>3. **ප්‍රධාන මාතෘකා වල අකුරු විශාල විය යුතුය.**<br>4. **ප්‍රධාන මාතෘකාවල ලියන වර්ණය තද වර්ණයක් විය යුතුය.**<br>5. **චිත්‍ර/රූප/සටහන් අදින්නේනම් සියල්ල දෘශ්‍ය වන ප්‍රමාණයට විශාල විය යුතුය.**<br>6. **කරුණු දැක්වීම සඳහා ඉලක්කම් හෝ සංඥා රූප භාවිතා කරන්න** |

| | |
|---|---|
| | 02. විද්‍යුත් ප්‍රක්ශේපන යන්ත්‍ර (Multi Media)<br>I. ඔබගේ ඉදිරිපත් කිරිම සඳහා වඩාත් උචිත පසුතලයක් තෝරා ගන්න.<br>II. ඔබගේ ඉදිරිපත් කිරිම කරනු ලබන කාලය අනුව ගැළපෙන වර්ණ භාවිතා කරන්න.<br>III. එක් පසුතලයක් සඳහා උපරිම පේළි 06 කට සීමා කරන්න.<br>IV. ප්‍රධාන මාතෘකා ඉස්මතුවන ලෙස සකසන්න.<br>V. උචිත සරල දර්ශන ක්‍රමවේදයන් භාවිතා කරන්න.<br>VI. සහභාගිකයන් සියළු දෙනාටම දර්ශනය වන ලෙස තිරය සකසන්න.<br>VII. සහභාගිකන් සියළු දෙනාටම ඇසෙන පරිදි ශබ්දවාහිණී යන්ත්‍ර භාවිතා කරන්න.<br>**03. වීඩියෝ ක්ලිප්ස්. (Video Clips)**<br>- පුහුණු වැඩසටහනේ අරමුණු සාක්ෂාත් වන අන්දමේ විද්‍යුත් වීඩියෝ යොදා ගැනීම.<br>**04. Zoop Card**<br>මේ සඳහා අඟල් 4' / 8' හා 4'/12 ප්‍රමාණයේ Card සකස් කළ යුතුය.(මීට අමතරව පුහුණුකරු විසින් තීරණය කරනු ලබන පුහුණු කිරීමේ ශිල්ප ක්‍රම භාවිතා කිරීමට කටයුතු කළ හැකිය. |
| **5. පුහුණු පාඨමාලාවේ සැසි සැලැස්ම සහ අන්තර්ගතය පිළිබඳව නැවත හැදෑරීම.** | 1. තමා විසින් සූදානම් කර ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන පුහුණු සැසි සැලැස්ම නැවත පරිශීලනය කළ යුතු අතර යාවත්කාලීන කළ යුතු නම් ඒ සඳහා පියවර ගත යුතුය.<br>2. මෙමඟින් නැවුම් වූ පුහුණු වැඩසටහනක් ඉදිරිපත් කිරීමට පුහුණුකරු තුළ ආත්ම විශ්වාසය ගොඩනැඟෙනු ඇත.එයට අන්තර්ජාලය, You Tube හා වෙනත් විද්‍යුත් පුහුණු මොඩියුල භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු කරන්න. |
| **6. පුහුණුවේ ඇගයීම.** | 01. පුහුණුව පිළිබඳව ධනාත්මක ලක්ෂණ හා වැඩි දියුණු කළ යුතු ලක්ෂණ පිළිබඳ පුහුණුවන්නන්ගේ අදහස් ලබා ගත යුතුය. මේ සඳහා පුහුණුව අවසානයේදී ඒ පිළිබඳ ඇගයීමක් ලබා ගැනීම අත්‍යවශ්‍යය වන අතර ඒ සඳහා,<br>➢ වාචික ප්‍රකාශන ලබා ගැනීම.<br>➢ පෙර සූදානම් කළ ප්‍රශ්නාවලියක් භාවිත කිරීම.<br>➢ ඇගයීම් සටහනක් මඟින් ඉහත තොරතුරු ලබා ගැනීම. |

## <u>පුහුණුකරු පුහුණුකරුගේ භූමිකාව හඳුනාගැනීම.</u>

**ක්‍රියාකාරකම - 01.**

A ග්‍රාමයේ තුළ ජීවත්වන ප්‍රජාව නොසිතූ මොහොතක වසංගත තත්ත්වයක් සඳහා මුහුණ දී ඇත. මේ හේතුවෙන් දැඩි සෞඛ්‍යය ගැටළුවකට ඔවුන් මුහුණ දෙන අතර එය සුවපත් කිරීමට ගත් සියළු ක්‍රියා මාර්ග අසාර්ථක වෙයි. අවසානයේ මොවුන් පිටසක්වල ජීවින්ගෙන් උපකාර පතා පණිවිඩයක් යවනු ලැබේ. මේ අනුව පිටසක්වල වෛද්‍ය කණ්ඩායමක් A ග්‍රාමයට පැමිණ ඔවුන්ගේ සෞඛ්‍යය තත්ත්වය පරික්ෂා කර බලා රෝග විනිශ්චය කරනු ලබන අතර ඒ සඳහා සුදුසු ප්‍රතිකාර ලබා දී නැවත මෙම තත්ත්වය උදා නොවීමට අවශ්‍ය උපදෙස් දී පිටව යයි. මේ අනුව A ග්‍රාමයේ පිරිස තම ප්‍රදේශයේ සියළු පාසල් දරුවන් හා ප්‍රජාව දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් දියත් කරයි.

මේ අනුසාරයෙන් සහභාගිකයන් සියළු දෙනා සහභාගී වී භූමි රංගනයක් ඉදිරිපත් කරනු ලැබේ.

## <u>ක්‍රියාකාරකම් සඳහා උපදෙස්.</u>

01. කණ්ඩායමේ සියළු සහභාගිකයින් සම්බන්ධ විය යුතුයි.
02. භූමිකා රංගනය අවසානයේදී ස්වයං ඇගයීමක් මඟින් කණ්ඩායමේ ධනාත්මක ලක්ෂණ හා තවදුරටත් වැඩි දියුණු විය යුතු ලක්ෂණ හඳුනා ගැනීම හා එම කරුණු පෙළ ගැස්වීම කල යුතුය.
03. අවශ්‍ය නම් මෙම භූමිකා රංගනය පිළිබඳව ස්වාධීන විනිශ්චය මණ්ඩලයක් ලබා දීම තුළින් ඇගයීමට ලක් කිරීමට අවස්ථාව ලබා දීම.
04. මාතෘකාවේ මුඛ්‍ය අරමුණු ඉස්මතු වන ආකාරයට මෙම රංගනය ගොඩනැංවීමට කණ්ඩායමට පුහුණුකරු විසින් අවශ්‍ය උපදෙස් ලබා දීම.
05. භූමිය රංගනය සඳහා උපරිම කාලය විනාඩි (30) කි.

## සැසි සැලැස්ම

| විෂය ක්ෂේත්‍රය | ගැටළු විසඳීම | ස්ථානය | |
|---|---|---|---|
| කාලය | එක් දිනයි පැය 08.00යි | ඉලක්ක කණ්ඩායම හා ප්‍රමාණය | |

| අනු අංකය | කාලය | උප විෂය ක්ෂේත්‍රයන් | ක්‍රමවේදය | උපකාරක |
|---|---|---|---|---|
| 1. | විනාඩි 15 | පුහුණුවේ අරමුණු පැහැදිලි කිරීම සහ පුහුණු වැඩසටහන් හඳුන්වා දීම. | **Power Point Presentation** | **Pp1** |
| 2. | විනාඩි 15 | සහභාගික කණ්ඩායම් හඳුනා ගැනීම. | **Name Game** | **ZOOP CARD & PEN** |
| 3. | විනාඩි 30 | පුහුණුකරුවා හා ඔහුගේ භූමිකාව. | පෙර සූදානම් කළ කතන්දරයක් ආධාරයෙන් භූමිකා රංගනයක් ඉදිරිපත් කිරීම. | රංග මෙවලම් (කණ්ඩායමේ අවශ්‍යතාවය මත) |
| 4. | විනාඩි 30 | පුහුණුකරුගේ පෞරුෂ්‍යත්වය. | පෙර සූදානම් කළ උප සිරස සහිත වීඩියෝ දර්ශන මඟින් පුහුණුකරුවාගේ ගුණාංග හඳුනාගනු ලැබේ. | පෙර සූදානම් කළ වීඩියෝ දර්ශන. |
| 5. | විනාඩි 15 | පුහුණු ක්‍රම ශිල්ප | ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යය භාවිතය මඟින් ඉදිරිපත් කිරීම. | පෙර සූදානම් කළ ශ්‍රව්‍ය දෘශ්‍ය උපකාරක. |
| 6. | විනාඩි 30 | පුහුණු විෂය හැදෑරීම සහ පුහුණුව සාර්ථකත්වය සඳහා මානසික සූදානම. | සූදානම් කළ පුහුණු මෙවලම් යාවත්කාලීන කිරීම සහ තොරතුරු දැනුම තුළින් අධ්‍යනය කිරීම. | අන්තර්ජාල/ **You Tube** පුහුණු මොඩියුල |
| 7. | විනාඩි 15 | වාචික හා පෙර සූදානම් කළ පත්‍රිකා. | වාචික හා පෙර සූදානම් කළ ඇගයීම් පත්‍රිකා තුළින්. | ඇගයීම් පත්‍රිකා. |

1. පුහුණු පහසුකාරක:........................................................................... 2. පුහුණු පහසුකාරක;...........................................................................